# පුංචි අපට ළමා කතන්දර



තෙනුජි රෙහානා සමරතුංගආරච්චි
මහ / උසස් බාලිකා විදූහල
මහනුවර

# පුංචි අපට ළමා කතන්දර

## තෙනුජි රෙහානා සමරතුංගආරච්චි
(කතෘ)

පළමු දිග හැරීම

මහ / උසස් බාලිකා විදුහල
මහනුවර
6 ශ්‍රේණිය G
2025 .02. 08

ISBN 978-624-208-577-7

# පිදුම

කුඩා කල සිට

සෙනෙහසින් මා හැදූ වැඩූ

අම්මාට අප්පච්චිට

මෙවන් අවස්ථාවක් උදා කරදුන්

මාගේ විදුහල්මැණියන්ට

මගේ මේ පළමු වෑයම

උපහාරයක්ම

වේවා!

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාවම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදී කතෘ කරදන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,
ශශිකලා සේනාධීර,
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

# පුංචි සමන්මලී

ඔන්න එකමත් එක රටක ගැහැනු ළමයෙක් හිටියා. ඇයගේ නම සමන්මලීය. ඇය හරිම කරුණාවන්තයි. සමන්මලීට මල්ලියෙක් සහ නංගියෙක් ඉන්නවා. ඇය ජීවත් වෙන්නේ අම්මයි, තාත්තයි, නංගියි සහ ඇයගේ මල්ලී සමඟය. පුංචි සමන්මලීට යහළුවෝ ගොඩක් දෙනෙක් ඉන්නවා. හැබැයි පුංචි සමන්මලීගේ හොඳම යාළුවෝ රෝසි , විනුකි සහ ගයුනිය.



සමන්මලීගේ යාළුවෝ හැමදාම ඇයගේ නිවසේ තිබෙන ගෙවත්තට සෙල්ලම් කරන්න පැමිණෙනවා. ඔන්න එකමත් දවසක සමන්මලීගේ යාළුවෝ ඇය සමඟ සෙල්ලම් කර කර සිටිද්දී කුරුලු පැටියෙක් බිම වැටී ඇති බව ඔවුන් දැක්කා. ඉන්පසුව ඔවුන් එතනට දුව ගොස් ගස උඩ සිටි කුරුලු අම්මාට කුරුලු පැටියාව භාර දුන්නා.



එවිට කුරුලු අම්මා සහ කුරුලු පැටියා සතුටින් ගී ගැයුවා.

අපිත් පුංචි සමන්මලී වගේ සතුන්ට කරුණාව දක්වමු.



# සඳුනිගේ උදව්ව

ඔන්න එකමත් එක ගෙදරක පුංචි පවුලක් ජීවත් වුණා. ඔවුන් හරිම දුප්පත්. ඔවුන්ගේ ගෙදර ඉන්නේ තාත්තා, අම්මා, ඇය සහ ඇයගේ මල්ලීය. ඇයගේ නම සඳුනිය. ඔන්න ඒ ගෙදර ඉන්න සඳුනිට සුබ ආරංචියක් ආවා. ඒක තමා ඇයට අලුත් පාසලකට යන්න හම්බ වන එක.



ඔන්න නිවාඩු කාලය අවසන් වුණා. අලුත් පාසල් වාරය පටන් ගත්තා. ඇයව අලුත් පාසලට ඇතුළත් කිරීමට එදා අම්මා සහ තාත්තා ඇය සමඟ පාසලට ගියා. ඔන්න ටික දවසක් ගත වුණා. ඇය ලොකු වුණා. සඳුනිගේ පාසල් වාර විභාගය ලං වුණා. ඇය එයට මුහුණ දුන්නා. ටික දවසකින් සඳුනිගේ වාර විභාගයේ ලකුණු දුන්නා. සඳුනි පළමුවෙනියා.

ඇය ඉතා සතුටින් ගෙදර ගියා. සඳුනි එකදවසක් දැක්කා ඇයගේ පන්තියේ ළමයෙක් විවේක කාලයේ දී මේසය මත ඔළුව තියාගෙන සිටින බව. සඳුනි ඊළඟ දවසේ ඇයගේ අම්මාට ඒ ගැන කිව්වා.

අම්මා සඳුනිට මෙහෙම  කිව්වා. අනේ පුතේ එයා පව්.

"එයා මේසය උඩ ඔළුව තියාගෙන ඉන්නේ කෑම ගේන්නේ නැතිව වෙන්න ඇති." අම්මා කිව්වා.

ඔව් අම්මේ,

"මම හෙට ඉඳලා ඔයාට කෑම දෙකක් දාලා දෙන්නම්. ඔයා ඒක විවේක කාලයේ දී යාළුවා සමඟ බෙදාගෙන කන්න." අම්මා කිව්වා.

හා අම්මේ මම එයාට ඒ කෑම එක දුන්නා. එයා ඒකට ස්තූති කරලා සතුටින් කෑවා.



ඉන්පසුව ඇය මා සමඟ සෙල්ලම් කිරීමට ක්‍රීඩා පිටියට ගියා. සඳුනිගේ අම්මා සහ තාත්තා ඇයව සහ මල්ලිව බදා ගෙන මෙහෙම කිව්වා.

පුතේ, නැති බැරි මිතුරන්ට කෑම ලබා දෙන එක ලොකු පිනක්. කියා අම්මා කිව්වා.



# <u>අසරණ දිනිති</u>

ඔන්න එකමත් එක ගමක දුප්පත් පවුලක් හිටියා. ඒ ගෙදර පුංචි ගැහැණු ළමයෙක් හිටියා. එයා ජීවත් වෙන්නේ ඇයගේ අත්තම්මා සමඟය. පුංචි ගැහැණු ළමයාගේ නම දිනිතිය. ඇය දිනපතාම පාසල් ගියා. ඇයගේ අත්තම්මා තම වගාවේ එළවළු විකුණලා තමයි සල්ලි හම්බ කරන්නේ. ඔන්න එකදවසක් දිනිති පාසල් ඇරී ගෙදර ඇවිල්ලා පිල උඩ ඉඳගෙන දුකින් ඉන්නවා. එවිට ඇයගේ අත්තම්මා එතනට ඇවිල්ලා දිනිතිගෙන් මෙහෙම ඇහුවා.

"ඇයි පුතේ ඔයා දුකින් ඉන්නේ අත්තම්මා ඇසුවාය. අනේ අත්තම්මේ, අපේ ටීචර් කිව්වා. "බෝනික්කෙක් ගේන්න කියලා." දිනිති කිව්වාය.


Welcome



දිනිති ඇඬුවා. ඉන්පසු ඇයවත්, ඇයගේ අත්තම්මාත් පුදුම කරමින් එතනට සුරංගනාවියක් මතු වුණා. සුරංගනාවිය දිනිතිගෙන් ඇහුවා.

ඇයි ළමයෝ ඔයා අඬන්නේ කියලා .දිනිති කිව්වා.

“මට හෙට පාසලට බෝනික්කෙක් ගේන්න කියලා.” අනේ ! “මම ඔයාට දැන්ම බෝනික්කෙක් දෙන්නම්” සුරංගනාවිය කිව්වා.

“ස්තූතියි, සුරංගනාවිය” දිනිති කිව්වා. දිනිති පාසල් ගියා. මැඩම් කිව්වා. අද හොඳම බෝනික්කව තෝරනවා කියලා. හොඳම බෝනික්කා ලෙස තේරුනේ දිනිතිගේ බෝනික්කාය. දිනිති සතුටින් ගෙදර ගිහිල්ලා ඒ විස්තරේ අත්තම්මට කිව්වා. අත්තම්මා සතුටු වුණා.



# නිමි...

# පසුවදන



රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළි දැක්වීමට වේදිකාවක් ගොඩ නැඟීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව **2014** වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල් වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්,දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරි මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මකව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යයන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවියන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ. තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

**ISBN 978-624-208-577-7**

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්